# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1813/20 - 2013 ජුනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### එරාවූර් නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

අවසර නොලබා අනුගාමී රැස්වීම් තුනකට වැඩි සංඛ්‍යාවකට නොපැමිණ සිටීමේ හේතුවෙන් එරාවූර් නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අකීල් අර්සාත් කේ. එල්. නම් වූ සභිකයා අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ එරාවූර් නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන ජමාල්ඩීන් මොහමඩ් මුස්තෆා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර් නගර සභාවේ තේරීම් භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, ජමාල්ඩීන් මොහමඩ් මුස්තෆා මහතා එරාවූර් නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
එරාවූර් නගර සභාව.

2013 ජුනි මස 03 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව

06 - 493


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 17736 — 350 (2013/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*